**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #May20**

පුවත්පතක ලිපියක් සඳහා භාවිතා වන භාෂාව කෙතරම් සැහැල්ලු විය යුතුද, බරසාර විය යුතුද යන්න එම පුවත්පත හා අනුබද්ධ වන කාරණාවකි. පාඨකයා වෙත වඩාත් සරල, සැහැල්ලු බසකින් පුවත් ඉදිරිපත් කිරීම කිසිසේත්ම වරදක් ලෙසින් දැකිය නොහැක. එසේ වුවත් ජනමාධ්‍යයක් ප්‍රවේසම් විය යුත්තේ එසේ සරල, සැහැල්ලු නැතිනම් කථා ව්‍යවහාරයට අනුවම යන බසකින් ලිපියක් ඉදිරිපත් කිරීමේදී මාධ්‍ය ආචාර ධර්මයන් කඩ වීමේ ඉඩකඩ සම්බන්ධයෙනි.

එයට උදාහරණයක් ලෙසින් ඉරිදා මව්බිම පුවත්පතෙහි මෙම ලිපිය පෙන්වා දිය හැක. එහිදී භාවිතා වී ඇති ඇතැම් වචන සහ ඒවායේ ව්‍යංගාර්ථයන් කාන්තාව පහත හෙළීමක් සිදු කරයි. එවැනි භාෂා භාවිතයක් පුවත්පතකට තරම් වේද යන්න අප නගනා පැනයයි.